# භූගෝල විද්‍යාව

## 5.1.1 ශ්‍රී ලංකාවේ නාගරීකරණය



Start Your Learning Journey with e-thaksalawa
The National e-learning Portal for The General Education

නිපුණතාවය 5 :- ශ්‍රී ලංකාවේ නාගරීකරණයේ ස්වභාවය අධ්‍යයනය කරමින් නාගරීකරණය ආශ්‍රිත ගැටලු පරීක්ෂා කරයි.

නිපුණතා මට්ටම 5.1 :- ශ්‍රී ලංකාවේ නාගරීකරණ ස්වභාවය අධ්‍යයනය කරයි.

නිපුණතා මට්ටම 5.2 :- ශ්‍රී ලංකාවේ නාගරීකරණ ගැටලු පරීක්ෂා කරයි.

ශ්‍රී ලංකාවේ නාගරීකරණය පාඩම අධ්‍යයනය තුළින් ඔබට පහත කරුණු පිළිබඳ අවබෝධයක් ලබා ගත හැකි වනු ඇත.

5.1.1 → ශ්‍රී ලංකාවේ නාගරීකරණයේ ස්වභාවය අවබෝධ කර ගැනීම.

5.1.2 → ශ්‍රී ලංකාවේ නාගරීකරණ ක්‍රියාවලියට බලපාන හේතු.

5.1.3 → ශ්‍රී ලංකාවේ නාගරීකරණයේ විවිධ මට්ටම් පැහැදිලි කර ගැනීම.

5.1.4 → ශ්‍රී ලංකාවේ නාගරීකරණයේ ප්‍රවනතා හා විවාදිත.

5.2.1 → ශ්‍රී ලංකාවේ නාගරීකරණය ආශ්‍රිත

- සමාජ ආර්ථික ගැටලු
- පාරිසරික ගැටලු

ශ්‍රී ලංකාවේ නාගරීකරණය ආශ්‍රිත සමාජ ආර්ථික හා පාරිසරික ගැටලු වලට විසඳුම්.



අන්තර්ගතය :- එච්.පී. ඉන්ද්‍රා කුමාරි මිය. ගුරු උපදේශිකා - දෙනුවර කලාපය
සැකසුම :- ප්‍රසංගිකා මධුෂානි මෙනවිය,ජාතික තරුණ සේවා සභාව (2017-2018)
පරීක්ෂා කිරීම- මල්ලිකා සෙනෙවිරත්න- ගුරු උපදේශිකා-ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය
Copyright © www.e-thaksalawa.moe.gov.lk




අන්තර්ගතය :- එච්.ජී. ඉන්ද්‍රා කුමාරි මිය. ගුරු උපදේශිකා - දෙනුවර කලාපය
සැකසුම :- ප්‍රසංගිකා මධුෂානි මෙනවිය,ජාතික තරුණ සේවා සභාව (2017-2018)
පරීක්ෂා කිරීම- මල්ලිකා සෙනෙවිරත්න- ගුරු උපදේශිකා-ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය

Copyright © www.e-thaksalawa.moe.gov.lk

# ශ්‍රී ලංකාවේ නාගරීකරණය

## හැඳින්වීම

නාගරීකරණය රටක සමාජ ආර්ථික සංවර්ධනය විදහා දක්වන කැඩපතක් බඳුය. ශ්‍රී ලංකාව සංවර්ධනය අතින් යම් මට්ටමක පැවතිය ද වාර්තා දත්ත අනුව නාගරීකරණය ආශ්‍රිතව මන්දගාමී වර්ධනයක් පෙන්නුම් කරයි. ලෝකයේ අඩුම නාගරීකරණ මට්ටමක් පෙන්නුම් කරන රටවල් දහය අතුරින් ශ්‍රී ලංකාව හත්වන ස්ථානයට පත්ව ඇත. දකුණු ආසියාතික රටවලට සාපේක්ෂව ශ්‍රී ලංකාව ඉහළ සමාජ වර්ධනයක් අත්පත් කර සිටිය ද නාගරීකරණය අතින් යම් පසු බෑමකට ලක් වී ඇත. 2012 වර්ෂය වන විට ශ්‍රී ලංකාවේ නාගරික ප්‍රදේශ සංඛ්‍යාව 64 ක් විය. එයින් 26 ක් ම ඉතා කුඩා නගර වේ.

ශ්‍රී ලංකාවේ නාගරීකරණය පිළිබඳ අධ්‍යනය කිරීම ඉතා අපහසු කාර්යයක් වී ඇත. නාගරික ප්‍රදේශ නිවරදිව අර්ථ දක්වා නොමැති වීම හා නාගරික ප්‍රදේශ හඳුනා ගැනීමේ නිර්ණායක වරින් වර වෙනස් වීම මීට හේතුවයි. ශ්‍රී ලංකාවේ නාගරීකරණය හඳුනා ගන්නේ පරිපාලන ඒකක ඇසුරිනි. ඒ අනුව වර්තමානයේ නගර සභා හා මහ නගර සභා පමණක් නාගරික තත්ත්වයෙහි ලා සලකයි. (1987 න් පසු)

2012 සංගණන වාර්තා අනුව මුළු ජනගහනයෙන් 18.2% ක් නාගරික ජන සංඛ්‍යාවට අයත් ය. ශ්‍රී ලංකාවේ ඇතැම් ග්‍රාමීය ප්‍රදේශවල නාගරික යැයි කියන ප්‍රදේශවලට වඩා ජනගහනය වැඩිය. එ නිසා ශ්‍රී ලංකාවේ නාගරීකරණය සුවිශේෂී තත්ත්වයකි. කෙසේ වෙතත් 21 වන සියවස ආරම්භයේදී රට තුළ සිදු වෙමින් පවතින්නා වූ සමාජ හා ප්‍රජා විද්‍යාත්මක වෙනස්කම් හා ආර්ථික ක්ෂේත්‍රයේ ඇති වූ වෙනස් කම් හේතුවෙන් නාගරීකරණ ක්ෂේත්‍ර ශීඝ්‍ර වර්ධනයක් පෙන්නුම් කරයි. නමුත් නාගරික වෙනසක ස්වභාවයක් දත්තවලින් නිරූපණය නොවීම ශ්‍රී ලංකාවේ නාගරීකරණය හා සම්බන්ධ සුවිශේෂී තත්ත්වයකි.



අන්තර්ගතය :- එච්.ජී. ඉන්ද්‍රා කුමාරි මිය. ගුරු උපදේශිකා - දෙනුවර කලාපය
සැකසුම :- ප්‍රසංගිකා මධුෂානි මෙනවිය,ජාතික තරුණ සේවා සභාව (2017-2018)
පරීක්ෂා කිරීම- මල්ලිකා සෙනෙවිරත්න- ගුරු උපදේශිකා-ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය

Copyright © www.e-thaksalawa.moe.gov.lk

# ශ්‍රී ලංකාවේ නාගරීකරණය

ශ්‍රී ලංකාවේ නාගරීකරණය

ශ්‍රී ලංකාවේ නාගරික ප්‍රදේශ සංඛ්‍යාව **64** කි.

නාගරික ප්‍රදේශ **26** ක් ම ඉතා කුඩා නගරය.

ශ්‍රී ලංකාවේ නාගරිකරණ ප්‍රතිශතය **18.2%**

ශ්‍රී ලංකාවේ නාගරික ජන සංඛ්‍යාවෙන් **50%** මෙම ප්‍රදේශවල ජීවත්වේ.

විශාලතම නාගරීක ප්‍රදේශ

- මහ නගර සභා
  කොළඹ,කඩුවෙල,දෙහිවල,ගල්කිස්ස,මොරටුව,මීගමුව,කෝට්ටේ
- නගර සභා
  කැස්බෑව,මහරගම

අන්තර්ගතය :- එච්.ජී. ඉන්ද්‍රා කුමාරි මිය. ගුරු උපදේශිකා - දෙනුවර කලාපය
සැකසුම :- ප්‍රසංගිකා මධුෂානි මෙනවිය,ජාතික තරුණ සේවා සභාව (2017-2018)
පරීක්ෂා කිරීම- මල්ලිකා සෙනෙවිරත්න- ගුරු උපදේශිකා-ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය
Copyright © www.e-thaksalawa.moe.gov.lk

## පැවරුම

(1)දියුණු වෙමින් පවතින රටවල නාගරීකරණ ලක්ෂණ ගැන සලකා බලන විට ශ්‍රී ලංකාව සුවිශේෂී වේ. ශ්‍රී ලංකාවේ නාගරීකරණය හා සම්බන්ධ සුවිශේෂිතා තුනක් දක්වන්න.

(2)පහත සඳහන් ප්‍රශ්න වලට කෙටි පිළිතුර සපයන්න.

I. ශ්‍රී ලංකාවේ නාගරික ප්‍රදේශ ගණන කොපමණ ද?
II. ශ්‍රී ලංකාවේ මුළු ජනගහනයෙන් නාගරික සංඛ්‍යාව ප්‍රතිශතයක් ලෙස කොපමණද?

(3)පහත සඳහන් වාක්‍ය හරි නම් ( √ ) ලකුණ ද වැරදි නම් ( X ) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

I. ශ්‍රී ලංකාවේ මහ නගර සභා පමණක් නාගරික ප්‍රදේශ ලෙස සලකයි. (    )
II. 2012 වන විට කුඩා නගර 26 ක් තිබුණි. (    )
III. ශ්‍රී ලංකාවේ නාගරික ජන සංඛ්‍යාවෙන් 50% මහ

(4) පහත දැක්වෙන නාගරික ප්‍රදේශ ශ්‍රී ලංකා සිතියමක ලකුණු කර ඇත.අදාළ නගරයට හිමි අක්ෂරය සිතියමෙන් තෝරා ලියන්න.




Copyright © www.e-thaksalawa.moe.gov.lk

අන්තර්ගතය :- එච්.ජී. ඉන්ද්‍රා කුමාරි මිය. ගුරු උපදේශිකා - දෙනුවර කලාපය
සැකසුම :- ප්‍රසංගිකා මධුෂානි මෙනවිය,ජාතික තරුණ සේවා සභාව (2017-2018)
පරීක්ෂා කිරීම- මල්ලිකා සෙනෙවිරත්න- ගුරු උපදේශිකා-ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය
Copyright © www.e-thaksalawa.moe.gov.lk

## පිළිතුරු

(1) කොළඹ නගරය කේන්ද්‍ර කරගෙන නාගරීකරණය සිදුවීම.
සැබෑ නාගරීකරණ මට්ටම සංඛ්‍යාත්මකව නිරූපණය නොවීම.
මන්දගාමී නාගරික වර්ධනයක් පැවතීම.

(2) (I) 64%
(II)18.2%

(3) (I) ×

(II) √

(III) ×

(4)

| නගරය | අක්ෂරය |
|---|---|
| කොළඹ | C |
| කඩුවෙල | B |
| දෙහිවල | D |
| ගල්කිස්ස | E |
| මොරටුව | F |
| මීගමුව | A |

Copyright © www.e-thaksalawa.moe.gov.lk

අන්තර්ගතය :- එච්.ජී. ඉන්ද්‍රා කුමාරි මිය. ගුරු උපදේශිකා - දෙනුවර කලාපය
සැකසුම :- ප්‍රසංගිකා මධුෂානි මෙනවිය,ජාතික තරුණ සේවා සභාව (2017-2018)
පරීක්ෂා කිරීම- මල්ලිකා සෙනෙවිරත්න- ගුරු උපදේශිකා-ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය
Copyright © www.e-thaksalawa.moe.gov.lk